# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

05 වසර / Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**පාලි - i** | කාලය : පැය තුන යි
**PALI - i** | Time : Three Hours

**I කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද, II කොටසේ 02 වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න තුනක් ද** තෝරාගෙන **ප්‍රශ්න 05 කට පමණක්** පිළිතුරු සපයන්න.

---

### I කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

I. පාලි භාෂාවේ **අඝෝෂ අල්පප්‍රාණාක්ෂර** ලියා දක්වන්න.

II. **ට ඨ ඩ ඪ ණ ර ළ** යන අකුරුවල උත්පත්ති ස්ථානය දක්වා ඊට අදාළ බාලාවතාර සූත්‍ර පාඨය ලියන්න.

III. **මුනි + ඉන්ද** යන පද දෙක බාලාවතාර සූත්‍රානුසාරයෙන් සන්ධි කර දක්වන්න.

IV. **වා පරො අසරූපා** යන සූත්‍රය හඳුන්වා උදාහරණ දෙකක් දෙන්න.

V. **රුක්ඛ, දාසි, අග්ගි, රත්ති** යන නාම පද අයත් ලිංග ලියා දක්වන්න.

VI. **සීතුණ්හං, ද්වඞ්ගුලං, සොතාපන්නො, නිරයො** යන රූප අයත්වන සමාස ප්‍රභේදය ලියා දක්වන්න.

VII. **කාරාපෙති, සමුනි, ඨත්වා, කරණීයං** යන පදවල ව්‍යාකරණ අංගය නම් කරන්න.

VIII. **දුතියා, දක්ඛී, මනුස්සත්තං, මායාවී** යන පදවල නාමය හා තද්ධිත ප්‍රත්‍යය වෙන්කර දක්වන්න.

IX. **සත්තමී** ආඛ්‍යාත පරස්සපදයට අයත් ප්‍රත්‍යය ලියා දක්වන්න.

X. මෙම පද යොදා වාක්‍ය දෙකක් සාදන්න. (අ) සද්ධිං (ආ) සන්තිකෙ

*(ලකුණු 04 × 10 = 40 යි)*

### II කොටස

02. (අ) පහත දැක්වෙන පාලි පාඨය සිංහලට නගන්න.

සො පන වත මයා මච්ඡො ලද්ධොති උක්ඛිපිත්වා පස්සන්තො සොවත්ථිකත්තාය දස්සනෙන සප්පොති සඤ්ජානිත්වා භීතො ආදීනවං දිස්වා ගහනෙ නිබ්බින්නො මුඤ්චිතුකාමො හුත්වා මුඤ්චනස්ස උපායං කරොන්තො අග්ගනංගුට්ඨතො පට්ඨාය හත්ථං නිබ්බෙඨෙත්වා බාහං උක්ඛිපිත්වා උපරි සීසෙ ද්වෙ තයො වාරෙ ආවිඤ්ඡිත්වා සප්පං දුබ්බලං කත්වා ගච්ඡ දුට්ඨසප්පොති නිස්සජ්ජිත්වා වෙගෙන තළාකපාළිමාරුය්හ මහන්තස්ස වත භො සප්පස්ස මුඛතො මුත්තො'ම්හීති ආගතමග්ගං ඔලොකයමානො අට්ඨාසි.

***නැතහොත්***

පහත සඳහන් ගාථා සිංහලට නගන්න.

ගච්ඡං වදෙසි සමණට්ඨිතො'ම්හි
මමං ච බ්‍රූසි ඨිතං අට්ඨිතොති
පුච්ඡාමි තං සමණ එතමත්ථං
කථං ඨිතො ත්වං අහමට්ඨිතො'ම්හීති.

ඨිතො අහං අංගුලිමාල සබ්බදා
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
තුවං ච පාණෙසු අසඤ්ඤතොසි
තස්මා ඨිතො'හං ත්වමට්ඨිතො'සීති.

*(ලකුණු 07 යි)*

(ආ) පහත සඳහන් එක් මාතෘකාවක් තෝරාගෙන වචන 25 කට නො අඩු රචනයක් පාලි භාෂාවෙන් ලියන්න.

(අ) මහා මහින්දත්ථෙරො

(ආ) අම්හාකං පරිවෙණං

***නැතහොත්***

පහත දැක්වෙන වාක්‍ය පාලි භාෂාවට පරිවර්තනය කරන්න.

I. ඔහු සුමේධගේ පියා ය. ඒ නිසා සුමේධ ඔහුගේ පුතා වේ.
II. නන්ද බුදුන් වහන්සේ සමඟ දෙව්රම් වෙහෙරට ගියේ ය. ඔහු නැවත නො ආවේ ය.
III. ඔහුගේ මව කවු ද? ඇය සුදර්ශනී නම් වෙයි.
IV. මම නිතර පිරිවෙණට යමි. පෙරළා පන්සලට එමි.

*(ලකුණු 08 යි)*

03.

I. පුල්ලිංග **අත්ත** ශබ්දය හා නපුංසකලිංග **චිත්ත** ශබ්දය සියලු විභක්තිවල වරනගන්න.

*(ලකුණු 09 යි)*

II. **(අ)** කුමාරිකා, මුඛ **(ආ)** මහාපුරිස, අනුව්‍යඤ්ජන **(ඉ)** ධීතු, විහාර යන පද විභක්ති ගන්වා සුදුසු පරිදි සකස් කොට යොදා පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.

(අ) තෙ තස්සා .......................... චන්දං විය .......................... පස්සන්ති.

(ආ) .......................... සරීරෙ අසීති .......................... සන්ති.

(ඉ) උපාසකො .......................... සද්ධිං .......................... ගන්ත්වා ධම්මං සුණන්ති.

*(ලකුණු 06 යි)*

04. (අ) **කරණෙ තතියා, අපාදානෙ පඤ්චමී, සංඛ්‍යාපූරණෙ මො** යන සූත්‍රවල අරුත් දක්වා නිදසුන් සපයන්න.

*(ලකුණු 08 යි)*

(ආ) ද්වන්ද සමාසය හඳුන්වා ඉතරීතරයෝග ද්වන්ද හා සමාහාර ද්වන්ද ප්‍රභේද නිදසුන් සහිතව පැහැදිලි කරන්න

*(ලකුණු 07 යි)*

05. (අ) චුර හා චර ධාතු අජ්ජතනී පරස්ස පදයේ වරනගන්න.

*(ලකුණු 08 යි)*

(ආ) පහත දැක්වෙන ක්‍රියාරූප අයත් වන ආඛ්‍යාත විභක්ති ලියා දක්වන්න.
පච්චති, මුඤ්චෙය්‍ය, තදවසරිං, සෙති, උදපාදි, ගච්ඡතු, ගණ්හි

*(ලකුණු 07 යි)*

06. (අ) සංඛ්‍යා තද්ධිතය හඳුන්වා ප්‍රත්‍ය 04 ක් තෝරාගෙන එකකට එක බැගින් උදාහරණ දෙන්න.

*(ලකුණු 09 යි)*

(ආ) කාසාව, තපස්සි, සතිමන්තු, සාමඤ්ඤ, අඤ්ඤථා, පච්ඡිම යන තද්ධිත පදවල නාමය හා තද්ධිත ප්‍රත්‍යය වෙන් කොට ලියා දක්වන්න.

*(ලකුණු 06 යි)*

07. (අ) √දා, √ලභ, √කර, √පා, වි+√නි, √භූ, √ඡිද, √භුජ, පාර+√ගමු යන ධාතු මගින් සාදාගත හැකි කිතක පදය බැගින් ලියන්න.

*(ලකුණු 09 යි)*

(ආ) කරණීය, ගත, හින්න, ගච්ඡන්ත, භුත්තාවී, භානු යන කිතක පදවල ධාතුව හා කිතක ප්‍රත්‍යය වෙන්කොට දක්වන්න.

*(ලකුණු 06 යි)*

08. (අ) ප්‍රත්‍ය තුනකටවත් නිදසුන් සපයමින් ස්ත්‍රී ප්‍රත්‍ය යෝගය හඳුන්වන්න.

*(ලකුණු 09 යි)*

(ආ) කාලාර්ථයේ සත්තමී ප්‍රයෝගය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

*(ලකුණු 06 යි)*

***

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

Primary Piriven Year End Term Test - 2016

05 වසර / Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**පාලි - ii** කාලය : පැය තුන යි

**PALI - ii** Time : Three Hours

**I** කොටසේ හා **II** කොටසේ ප්‍රශ්න **සියල්ලට ම** ද, **III** කොටසින් ප්‍රශ්න **එකක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**I කොටස**

01. පහත දැක්වෙන (i) සිට (x) තෙක් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවා වාක්‍ය නැවත ලියන්න.

(i) (අ) ධම්මපදට්ඨකථාව රචනා කිරීමට ආරාධනා කරන ලද්දේ .................................. (කුමාරකස්සප හිමියන් /ලීලාවතී රැජිණ) විසිනි.

(ආ) කොසොල් රජතුමා භික්ෂූන් කෙරෙහි නොපැහැදුණු අවස්ථාවක් දැක්වන්නේ................................(චූල්ලතිස්සත්ථෙර/ කෝසම්බක) වත්ථුවෙහි ය.

(ii) (අ) ''අයං පවිසන්තො'පි මං අක්කමෙය්‍යා'ති'' යන මෙම පාඨය උපුටාගෙන ඇත්තේ ................................ (චූල්ලතිස්සත්ථෙර/ චක්ඛුපාලත්ථෙර) කථාවෙනි.

(ආ) 'දීපභාසා' යනුවෙන් ධම්මපදට්ඨකථාවෙහි දැක්වෙන්නේ ....................................... (සිංහල /පාලි) භාෂාව ය.

(iii) (අ) දාඨාවංසයෙහි කතුවරයා ....................................... (බුද්ධඝෝස හිමි/ධම්මකිත්ති හිමි) ය.

(ආ) දාඨාවංශයෙහි පරිච්ඡේද ගණන ....................................... (03/05 ) කි.

(iv) (අ) බුදුරජාණන් වහන්සේ සමනලගිරෙහි පා සටහන් තැබුයේ ...................................... (දෙවනවර/තෙවනවර) ලංකාවට වැඩි අවස්ථාවේදී ය.

(ආ) බුදුරජාණන් වහන්සේ අනිමිස ලෝචන පූජාව කළේ බුද්ධත්වයෙන් ................................... (පළමු/දෙවන) සතියේ දී ය.

(v) (අ) අභිනවසාසනවංසය රචනා කිරීමට ආරාධනා කරන ලද්දේ ...................................... (රතනජෝති/ජිනරතන) නම් හිමි නමක විසිනි.

(ආ) අභිනවසාසනවංසයෙන් ප්‍රාමාණික තොරතුරු සොයා ගත නො හැක්කේ ......................................(බුද්ධ චරිතය/අමරපුර නිකාය) පිළිබඳ ය.

*(ලකුණු 20 යි)*

- පහත සඳහන් පාලි පාඨ සිංහලයට නගන්න.

(vi) තස්සා පන සා සයමෙව නිච්චං යාගුභත්තං දෙති, අථ'ස්සා ආහාරෙනෙව සද්ධිං ගබ්භපාතනභෙසජ්ජං අදාසි.

(vii) සො අනුපුබ්බෙන තං ගාමං පත්වා ගාමද්වාරෙ එකං මහල්ලකං දිස්වා "ඉමං ගාමං නිස්සාය කොචි ආරඤ්ඤකො විහාරො අත්ථී" ති පුච්ඡි.

(viii) සදෙසභාසාය කවීහි සීහළෙ
කතම්පි වංසං ජිනදන්තධාතුයා,
නිරුත්තියා මාගධිකාය වුද්ධියා
කරොමි දීපන්තරවාසිනං අපි.

(ix) ධාතුයො අවසිස්සිංසු - මුත්තාභා කඤ්චනප්පභා,
අධිට්ඨානෙන බුද්ධස්ස - විප්පකිණ්ණා අනෙකධා.

(x) හුත්වාන උපසම්පන්නො - අත්තසත්තමකො සුධී,
උග්ගහෙත්වාන ධම්මඤ්ච - විනයඤ්චාපි සාධුකං.

*(ලකුණු 20 යි)*

## II කොටස

02\. (i) සිංහලයට පරිවර්තනය කරන්න.

අථෙ'කො මක්කටො තං හත්ථිං උට්ඨාය සමුට්ඨාය දිවසෙ දිවසෙ තථාගතස්ස ආභිසමාචාරිකං කරොන්තං දිස්වා අහම්පි කිඤ්චිදෙව කරිස්සාමීති විචරන්තො එකදිවසං නිම්මක්ඛිකං දණ්ඩකමධුං දිස්වා දණ්ඩකං භඤ්ජිත්වා දණ්ඩකෙනෙව සද්ධිං මධුපටලං සත්ථු සන්තිකං ආහරිත්වා කදලීපත්තං ඡින්දිත්වා තත්ථ ඨපෙත්වා අදාසි. සත්ථා ගණ්හි. මක්කටො කරිස්සති නු ඛො පරිභොගං න කරිස්සතී ති ඔලොකෙන්තො ගහෙත්වා නිසින්නං දිස්වා කින්නුඛොති චින්තෙත්වා දණ්ඩකොටියං ගහෙත්වා පරිවත්තෙත්වා උපධාරෙන්තො අණ්ඩකානි දිස්වා තානි සනිකං අපනෙත්වා අදාසි. සත්ථා පරිභොගමකාසි.

*(ලකුණු 10 යි)*

(ii) තිරිසන්ගත සතුන් පවා බුදුන් කෙරෙහි සිත පහදාගෙන ස්වර්ගලෝක සම්පත් විඳි අයුරු ධම්මපද අට්ඨකථාවේ කෝසම්බක වත්ථුව ඇසුරින් පැහැදිලි කරන්න.

*(ලකුණු 05 යි)*

03\. (i) සිංහලයට නගන්න.

ආලොකං දස්සයිත්වා'ථ - අස්සාසෙත්වාන භොගිනො,
සාමග්ගිකරණං ධම්මං - අභාසි පුරිසාසභො.

අසීතිකොටියො නාගා - අචලම්බුධිවාසිනො,
පතිට්ඨහිංසු මුදිතා - සීලෙසු සරණෙසු ච.

දත්වා මණිපල්ලඞ්කං - සත්ථුනො භුජගාධිපා,
තත්ථාසීනං මහාවීරං - අන්නපානෙහි තප්පයුං.

පතිට්ඨපෙත්වා සො තත්ථ - රාජායතනපාදපං,
පල්ලඞ්කං තඤ්ච නාගානං - අදාසි අභිපූජිතුං. *(ලකුණු 10 යි)*

(ii) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය පිළිබඳ තොරතුරු දාඨාවංසය ඇසුරින් ගෙනහැර දක්වන්න.

*(ලකුණු 05 යි)*

04\. (i) සිංහලයට නගන්න.

ආනන්දථෙරවරසද්ධිවිහාරිකාසුං
සංගීතිකා දසබලම්පි ච දිට්ඨපුබ්බා,
ථෙරා තථා සුමනවාසභගාමිනාමා
ද්වෙමෙනුරුද්ධයතිසද්ධිවිහාරිකාසුං.

නිට්ඨාපිතා යම්තිවාසි යතොට්ඨමාසා
ථෙරෙහි තෙහි පන සත්තසතෙහි තස්මා,
ඛ්‍යාතාසි සත්තසතිකාති පුරාකතං හි
නිස්සාය විස්සුතවතී දුතියාති ලොකෙ. *(ලකුණු 10 යි)*

(ii) දෙවන ධර්මසංගායනාව පිළිබඳ අභිනවසාසනවංසයෙන් හෙළිවන තොරතුරු සාකච්ඡා කරන්න.

*(ලකුණු 05 යි)*

## III කොටස

05\. භික්ෂූන් වහන්සේලා භේදවීම සමස්ත සමාජයට බලපාන්නේ කෙසේ දැයි ධම්මපදට්ඨකථාවේ කෝසම්බක වත්ථුව ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 15 යි)*

06\. දාඨාවංස කෘතියෙන් හෙළිවන සම්බුද්ධ පරිනිර්වාණය පිළිබඳ තොරතුරු පෙන්වා දෙන්න. *(ලකුණු 15 යි)*

***